**සැ. යු.** - 2016.09.02 දින පළ වූ අංක 1983 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,984 - 2016 සැප්තැම්බර් මස 09 වැනි සිකුරාදා - 2016.09.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1584 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1587 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1601 |

*සැ. යු.* - වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත 2016 ජුනි මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 සැප්තැම්බර් මස 30 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 සැප්තැම්බර් මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**බී. කේ. එස්. රවීන්ද්‍ර**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2016 ජුනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවය

### බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවත්නා තනතුරු වෙනුවෙන් බඳවා ගැනීම සඳහා 2016.08.05 දින අංක 1979 දරන ගැසට් පත්‍රයේ (iv)ආ වැනි කොටසේ පළකරන ලද නිවේදනයේ අධ්‍යාපන සුදුසුකම් පහත පරිදි සංශෝධනය කරන අතර ඒ අනුව අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2016.09.30 දක්වා දීර්ඝ කරමි.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* | *තනතුරු ගණන* | *අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහායක | රු. 24,250-10x250-10 x270-10 x 300-12 x 330 - රු. 36,410 | 01 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහ (05)ක් එකවර සමත් විය යුතුය. |

එන්. ඩී. අයි. ස්වර්ණා කේ. පෙරේරා,<br>
ලේකම්,<br>
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

2016 අගෝස්තු මස 22 වැනි දින,<br>
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව,<br>
පානදුර පාර,<br>
බණ්ඩාරගම.

09-409

---

## ගම්පොල නගර සභාව

### ගම්පොල නගර සභාවේ ප්‍රාථමික මට්ටමේ ශිල්පීය නොවන ආයතනගත තනතුරුවල පුරප්පාඩු පිරවීම

ගම්පොල නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් උපලේඛනයේ තනතුරුවලට බඳවා ගැනීමට උපලේඛනයේ සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලද ගම්පොල නගර සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත ක්‍රමය හා වැටුප් පරිමාණය* | *අවශ්‍ය අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|
| රියදුරු III පංතිය (මෝටර් රථ/ ට්‍රැක්ටර්/ ලොරි) | | *වැටුප් කේතය* PL3-2006 A *වැටුප් ක්‍රමය* රු. 12,470-10x 130-10 x 145-10x160 -12 x 170- රු. 18,860 මුල් පත්වීමේ දින සිට වැටුප් ක්‍රමයේ රු. 12,470 වන ආරම්භක පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ. | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්වී තිබීම. සහ වෘත්තියට අදළ සුදුසුකම් වන මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ එක් එක් තනතුරට අදළ වන කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබාතිබීම හා මෝටර් රථ වාහන පැදවීමේ බලපත්‍රය |

| *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත ක්‍රමය හා වැටුප් පරිමාණය* | *අවශ්‍ය අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|
| | | | ලැබීමෙන් පසු වසර 03ක පළපුරුද්ද ලබාතිබීම. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)<br><br>*කායික සුදුසුකම් :*<br>1. සෑම අපේක්ෂකයකුටම මනා දෑස් පෙනීමක් තිබිය යුතු අතර, දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්තවිය යුතුය.<br>2. අවම උස අඩි 5 අඟල් 2 1/2ක් විය යුතුය.<br>3. මහා මාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.<br>4. මූලික සුදුසුකම් ලබන්නන් ව්‍යූහගත හා ලිඛිත පරීක්ෂණයට භාජනය කෙරේ. |
| පෙදරේරු II | 01 | PL2-2006 A<br>වැටුප් ක්‍රමය<br>රු. 12,210-10x 130-10 x 145-10 x 160 -12 x 170- රු. 18,600<br><br>මුල් පත්වීමේ දින සිට වැටුප් ක්‍රමයේ රු. 13,655 වන 12වන පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ.<br><br>(4 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම.<br>සහ<br>වෘත්තියට අදළ ජාතික වෘත්තීය සුදුසුකම් 2 වන මට්ටමේ (NVQ 2) හෝ 3 වන මට්ටමේ (NVQ 3) සහතිකය ලබා තිබීම<br>හෝ<br>කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදරා සහතික ලබා ගැනීම<br>හෝ<br>ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදරා සහතිකය ලබා තිබීම.<br>හෝ<br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තිය ට අදාව එක් වසරකට නොඅඩු පාඨාමාලාවක් හදරා සහතිකය ලබා තිබීම<br>හෝ<br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාලව එක් වසරක පාඨමාලාවක් හදරා සහතික ලබා තිබීම<br>හෝ<br>තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතික ලබා තිබීම.<br><br>*පළපුරුද්ද :*<br>අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම ( පුහුණු කාලසීමාව යටත් පිරිසෙයින් අවු. 02 ක් වත් විය යුතුය. |

3. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-

3.1 මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

3.2 වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

3.3 තුන් අවුරුදු පරිවාස කාලයට යටත් විය යුතුය.

3.4 මෙම බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, රජය හා මධ්‍යම පළාත් රජය හා සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට යටත්ව සේවය කිරීමට බැඳී සිටී.

4. බඳවා ගැනීමේ වෙනත් කොන්දේසි :-

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙන් විය යුතු යි.
2. අයදුම්කරුවන් ගම්පොළ නගර සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන් විය යුතුය. (අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් මෙම බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.)
3. අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
4. දැනට ගම්පොල නගර සභාවේ තාවකාලික/අනියම්/ආදේශක පදනම මත සේවයේ නියුතු සේවකයින්ට වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.
5. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.
6. විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සන් තෝරාගනු ලබයි.
7. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු හෝ දඬුවම ලැබූවෙකු නොවිය යුතුයි.
8. සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.
9. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය ගම්පොල නගර සභාවේ ලේකම් සතු ය.

5. අයදුම් කිරීමේ පිළිවෙල :-

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි A4 ප්‍රමාණයේ අයදුම්පතක් සකස් කර ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2016.09.30 දිනට පෙර ලේකම්, නගර සභාව, ගම්පොළ යන ලිපිනයට ලියා ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලි සහතික කළ පිටපතක් එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතික;
3. හැඳුනුම්පතේ ඡායා පිටපතක්;
4. පදිංචිය සනාථ කිරීමේ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය;
5. මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්;
6. පළපුරුද්ද වෘත්තීය සුදුසුකම් සම්බන්ධ සහතික.

එම්. ඒ. ගාමිණී ජයවික්‍රම,
ලේකම්,
ගම්පොල නගර සභාව.

ගම්පොල නගර සභාව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ගම්පොල නගර සභාවේ ........................................................තනතුර සඳහා වූ අයදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම :——————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.
03. ස්ථිර ලිපිනය :——————————.
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
05. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
06. උපන් දිනය : අවුරුද්ද :————, මාසය :————, දිනය :————
07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ
අවුරුදු :————, මාස :————, දින :————

08. ස්ත්‍රී/පුරුෂ භාවය :—————
09. විවාහක/අවිවාහක බව :—————
10. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද ? ලියාපදිංචිවීමෙන් ද? :—————
11. අධ්‍යාපන සුදුසුකම් :—————
12. වෙනත් සුදුසුකම් :—————
13. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් :—————
    1. දැනට දරන තනතුර :—————
    2. ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් ද යන වග :—————
    3. එම තනතුරට පත්වූ දිනය :—————
14. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද ? :—————

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත්වන බව ද දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:—————

*දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/කාරිය වන ......................................... මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ ................................ වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි /නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

—————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :—————
තනතුර :—————
නිල මුද්‍රාව :—————

09-470

# පළාත් පාලන නිවේදන

## මැදගම ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, මැදගම ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් නියමය කිරීමට තීරණය කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. හේමරත්න බණ්ඩාර,
සභාලේකම්,
මැදගම ප්‍රාදේශීය සභාව.

2016 අගෝස්තු මස 10 වැනි දින,

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර මැදගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගාකළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා එකී යම් දේපළක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය පිළිබඳ වාර වාර්තා සපයන ලෙස නියම කළ යුතු යයි, එකී පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන්, එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මම මෙයින් තීරණය කරමි.

09-219

## කලවාන ප්‍රාදේශීය සභාව

### 1975 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24(2) වගන්ති යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්ති ප්‍රකාර සබරගමු පළාත් සභාවේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කලවාන ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත්, කලවාන ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොදා ඇති මංමාවත් සම්බන්ධයෙන් අදළ ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම්පාන පාර්ශ්වයන් විසින් යම් විරුද්ධතාවයක් පලකරනු ලබන්නේ නම්, මෙම නිවේදනයේ සිට එක් මසක් ඇතුලත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්ති ප්‍රකාර ක්‍රියාකරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

යූ. ජී. ධර්මවර්ධන,
ලේකම්/කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කලවාන ප්‍රාදේශීය සභාව.

2016 ජූලි මස 26 වන දින,
කලවාන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

| අංකය | පාරේ නම | දිග (කි. මී.) | පළල (මී.) |
|---|---|---|---|
| 01 | 17 කණුව ළඟ සිට ජයවර්ධන මහතාගේ ඉඩම හරහා දෙඩම්වල දක්වා පාර | 1.6 | 3.7 |
| 02 | වේවැල්කඳුර පාලම ළඟ සිට සොහොන්පිටිය හරහා අක්කර 18 දක්වා පාර | 1.6 | 3.7 |
| 03 | වේවැල්කඳුර කිරිල්ලගහදෙනිය හරහා අක්කර 18 දක්වා පාර | 1.6 | 3.7 |
| 04 | තිනිඹිටිට අකුලහෙන් හරහා සුදුවැලිපත පාර | 2.4 | 3.7 |
| 05 | වේවැල්කඳුර දිසානායක මහතාගේ නිවස ළඟ සිට අතපත්තුමූකලාන පාර | 2.4 | 2.5 |
| 06 | පරකුඹුර අලුත්වත්ත හරහා මැදගොඩ පාර | 2.4 | 3.7 |
| 07 | කලවාන හඟරංගල හරහා පනහැටගල පාර | 6.4 | 6.0 |
| 08 | කලවාන බෙල්ලන කඩේ සිට වැලිකුඹුර හරහා මානාන පාර | 2.4 | 6.0 |
| 09 | කලවාන පට්ටියගොඩැල්ල හරහා අලුබොගහදෙනිය පාර | 3.2 | 3.7 |
| 10 | වටවලගොඩ පාලම ළඟ සිට කරව්වාන පාර දක්වා | 3.2 | 3.7 |
| 11 | හඟරංගල ලොකුඅප්පුහාමි මහතාගේ වත්ත හරහා කරව්වාන පාර | 3.2 | 3.7 |
| 12 | කලවාන පහලවකන්ද හරහා ගල්පොත්තවිල දක්වා පාර | 0.8 | 3.7 |
| 13 | පාලින්දගොඩ සොහොන්පිටිය පාර | 0.8 | 3.7 |
| 14 | කලවාන රජ්ජුරුවත්ත හරහා කුරුඳුකොළණිය පාර (ඉන්දෙල දක්වා) | 4.8 | 6.0 |
| 15 | ගලපැලැස්ස හන්දියේ සිට අඹගහවත්ත සමන්පුර හරහා මල්වලා කැලේ පාර | 4.8 | 6.0 |
| 16 | අඹගහවත්ත සිට අන්. වී. ආර්. සෙනවිරත්න මහතාගේ ඉඩම හරහා මාලු ගොඩැල්ල දක්වා පාර | 0.8 | 3.7 |
| 17 | ටකරන් කඩේ ළඟ සිට පී. ඇම්. දියුණුහාමි මහතාගේ ඉඩම හරහා උගුඩුකන්ද පාර | 1.8 | 6.0 |
| 18 | ටකරන් කඩේ මහකුඹුර අසලින් ගුලනහේන දක්වා පාර | 3.2 | 3.7 |
| 19 | අඹගහවත්ත මහගෙදරවත්ත හරහා මැදගොඩ දක්වා පාර | 1.6 | 3.7 |
| 20 | අඹගහවත්ත ඉහළ කුඹුර අසලින් ගුලනහේන දක්වා පාර | 0.4 | 2.5 |
| 21 | මැදගොඩ සිට ගොඩේවත්ත හරහා අලුත්වත්ත දක්වා පාර | | |
| 22 | රජ්ජුරුවත්ත පුංචි බංගලාව ළඟ සිට වික්‍රමනායක මහතාගේ ඉඩම අයිනෙන් ඇල්ලපිටහේන දක්වා පාර | 1.6 | 3.7 |
| 23 | කෙරමිල්ල ඇළ ළඟ සිට දොලහේන හරහා මල්වලාකැලේ | 2.4 | 3.7 |
| 24 | කලවාන තැපැල් කාර්යාලය ඉදිරිපිට සිට දෙළහේන හරහා කවුඩුවැල් බට හේන්යාය දක්වා පාර | 2.4 | 3.7 |
| 25 | පොදු වෙළඳපල භූමිය අසල සිට ජෝන් මුදලාලිගේ නිවස අසලින් රද්දැල්ල දක්වා පාර | 0.8 | 3.7 |
| 26 | කලවාන පොලීසිය ඉදිරිපිට සිට දිද්දමනහේන්යාය හරහා වැද්දගල පාරට වැටෙන පාර | 1.2 | 6.0 |
| 27 | තපස්සරකන්ද විල්සන් මහතාගේ නිවස අසල සිට කවුඩුවැල්බටහේන්යාය දක්වා පාර | 1.2 | 3.7 |
| 28 | කලවාන පොදු ක්‍රීඩා පිටිය ඉදිරිපිටසිට විල්බට් පෙරේරා මහතාගේ නිවස අසලින් ගල්පොත්තවල - සිසිලියන්වත්ත හරහා තලස්සරකන්ද දක්වා පාර | 4.0 | 5.5 |

| අංකය | පාරේ නම | දිග (කි. මී.) | පළල (මී.) |
|---|---|---|---|
| 29 | තපස්සරකන්ද සල්ගහ අසල සිට ක්‍රීඩා පිටිය අසලින් කොස්වත්ත දක්වා පාර | 0.8 | 6.0 |
| 30 | තපස්සරකන්ද සිට තපස්සරකන්ද විද්‍යාලය අසලින් ගොල්ලුම්පාන දක්වා පාර | 1.2 | 5.5 |
| 31. | තපස්සරකන්ද සිට කුරුපොත දක්වා පාර | 1.6 | 3.7 |
| 32. | ගල්කැටිය සිට කවුඩුවැල්බටහේන්යාය හරහා මල්වලාකැලේ දක්වා පාර | 3.2 | 3.7 |
| 33. | බෙලිඅත්තවිල සිට නාරගල්පිටිය හරහා විශ්කම්ගොඩ දක්වා පාර | 3.2 | 3.7 |
| 34. | මීපාගම සිට ජාතුවංගොඩ කම්බි පාලම හරහා මල්කඩුව හන්දිය දක්වා පාර | 2.4 | 3.7 |
| 35. | පරගහයට කඩේ ළඟ සිට පල්ලෙකන්ද හරහා කුඩුමීරියවත්ත දක්ව  පාර | 1.6 | 6.0 |
| 36. | පහළ කුකුළේගම පාළම ළඟ සිට ජාතුවංගොඩ හරහා දෙනිහේන දක්වා පාර | 4.8 | 3.7 |
| 37. | පහළ කුකුළේගම පාළම ළඟ සිට ලියනගොඩ හරහා පිටිගලකන්ද දක්වා පාර | 6.4 | 3.7 |
| 38. | ලියනගොඩ සිට කදුරුකොට ඇලඑලවැල්ල හරහා දෙල්ගොඩ කොන්ක්‍රීට් පාලම දක්වා පාර | 5.6 | 3.7 |
| 39. | විශ්කම්ගොඩ කම්බි පාලම ළඟ සිට හතරමංහන්දිය හරහා ඔබේරත්න වෙද මහතාගේ නිවසට හැරෙන හන්දිය දක්වා | 0.4 | 3.7 |
| 40. | කොඩිප්පිලිකන්ද සිට හොරකඳහේනවත්ත දක්වා පාර | 0.4 | 6.0 |
| 41. | කිරිමඩුපොළ සිට බඹරකොටුව සමූපකාරය දක්වා පාර | 1.6 | 3.7 |
| 42. | නාවලකන්ද සිට ඉන්ගල්පොත්ත හරහා දෙල්කඳඇළ දක්වා පාර | 4.0 | 3.7 |
| 43. | කොක්කාවිට සිට වැවගම හරහා කුඩවඇල්ල දක්වා පාර | 8.0 | 6.0 |
| 44. | වැලිවල සිට කොක්කාවිට වත්ත හරහා පිට කැලේ දක්වා පාර | 4.8 | 2.5 |
| 45. | කරුවලදොල සිට පෙතියකන්ද වත්ත දක්වා පාර | 1.6 | 2.5 |
| 46. | කොක්කාවිට සිට දියපිල්ල හරහා වැල්පොත දක්වා පාර | 4.4 | 6.0 |
| 47. | දිය පීල්ල ළඟ සිට බෝබුවල දක්වා පාර | 1.6 | 3.7 |
| 48. | ඉබ්බන්වල ළඟ සිට වෙම්බියගොඩ හරහා කොතලාවල හන්දිය දක්වා පාර | 3.2 | 6.0 |
| 49. | ඕබොක්ක සිට අක්කර 100 වත්ත හරහා කරව්වාන පාර දක්වා | 4.8 | 6.0 |
| 50. | වෙම්බියගොඩ පාලම ළඟ සිට ගාමිණී විද්‍යාලය හරහා කොස්වත්ත දක්වා පාර | 1.2 | 6.0 |
| 51. | වෙම්බියගොඩ පාලම ළඟ සිට යහල බැන්ද හරහා දවුගලගම දක්වා පාර | 3.2 | 3.7 |
| 52. | කොස්වත්ත හන්දිය සිට කොලොන්න ඇල්ල හරහා විශ්කම්ගොඩ කම්බිපාලම දක්වා පාර | 2.4 | 6.0 |
| 53. | කොස්වත්ත පාලම ළඟ සිට ගැටපාත පන දක්වා පාර | 1.2 | 6.0 |
| 54. | කොස්වත්ත සිට දිද්දමනහේන්යාය දක්වා පාර | 0.8 | 3.7 |
| 55. | දවුගලගම උප තැපැල් කාර්යාලය අසල සිට එලවැල්ල කොන්ක්‍රීට් පාළම පාර | 0.7 | 3.7 |
| 56. | දවුලගම සිට ගල්ගනහේන්යාය දක්වා පාර | 1.2 | 2.5 |
| 57. | දෙල්ගොඩ සිට ගොරොක්ගල වත්ත හරහා වැවගම දක්වා පාර | 4.0 | 6.0 |
| 58. | දෙල්ගොඩ හන්දයේ සිට දඹල ඇල හරහා බස්පාරට වැටෙන (වතුරාව) හරස් පාර | 0.8 | 6.0 |
| 59. | ඇල්ලබඩවත්ත සිට ආරණ්‍ය හරහා වතුරාව පාර | 3.2 | 3.7 |
| 60. | නිල්වැලිපත සිට පිටවතුරාව හරහා දෙල්ගොඩ තේ කර්මාන්ත ශාලාව දක්වා පාර | 4.8 | 2.5 |
| 61. | පිට වතුරාව සිට අංගොඩකන්ද දක්වා පාර | 3.2 | 2.5 |
| 62. | වත්තේහේන සිට කිරල්දෙනිය දක්වා පාර | 2.4 | 6.0 |
| 63. | වතුරා ජනපදය නිලධාරි නිල නිවස අසල සිට වතුරාව විද්‍යාල භූමිය හරහා පනහැටගල ගම්මායිම දක්වා පාර | 1.6 | 6.0 |
| 64. | උතුරු වැද්දාගල වංගුදොල අසල සිට කැටවලකන්ද දක්වා පාර | 1.0 | 2.5 |
| 65. | උතුරු වැද්දාගල සිට කැටවලකන්ද දක්වා පාර | 1.6 | 2.5 |
| 66. | උතුරු වැද්දාගල විද්‍යාලය අසල සිට පුහුල්පැල්පොල දක්වා පාර | 2.0 | 2.5 |
| 67. | උතුරු වැද්දාගල විද්‍යාලය අසල සිට පුහුල්පැල්පොල දක්වා පාර | 2.0 | 2.5 |
| 68. | මාවතදෙනිය අසල සිට කුන්දෙවත්ත හරහා කැටවලකන්ද දක්වා පාර | 2.0 | 2.5 |
| 69. | වැද්දගල සිට පදුපැල්පොල හරහා බලවතුකන්ද දක්වා පාර | 3.6 | 2.5 |
| 70. | වැද්දගල සිට පුහුල්පැල්පොල හරහා වැවගම දක්වා පාර | 4.0 | 5.5 |
| 71. | වැද්දගල සිට සිංහරාජ පාරේ සිට මියනපලාව දක්වා පාර | 1.6 | 2.5 |
| 72. | වැද්දගල සිට පුස්සැල්කැටිය දක්වා පාර | 3.0 | 2.5 |
| 73. | බුත්කන්ද සිට කුඩව විද්‍යාලය දක්වා පාර | 1.5 | 6.0 |

| අංකය | පාරේ නම | දිග (කි. මී.) | පළල (මී.) |
|---|---|---|---|
| 74. | කුඩව සිට පෙතියකන්ද කරුවලදෙල දක්වා පාර | 2.2 | 5.0 |
| 75. | කුඩව සිට පිටකැලේ හරහා අතුරු දෙල දක්වා පාර | 1.5 | 3.7 |
| 76. | කුඩව සිට කෙටලපත්තල හරහා උඩගෙදර වත්තදෙල දක්වා පාර | 3.0 | 2.5 |
| 77. | කුඩව සිට පෙතියකන්ද ඇල්ල දක්වා පාර | 1.0 | 2.5 |
| 78. | පෙතියකන්ද පන්සල ළඟ සිට බුත්කන්ද දක්වා පාර | 1.0 | 2.5 |
| 79. | පෙතියකන්ද කරුවල දෙල ළඟ සිට පිටකැලේ දක්වා පාර | 1.2 | 2.5 |
| 80. | වැද්දගල සිට ගමගෙපැත්ත හරහා පනාපොළ දක්වා පාර | 6.0 | 6.0 |
| 81. | වැද්දාගල රණසිංහ කඩේ ඉදිරිපිට සිට කටුගහකන්ද තේ කර්මාන්තශාලාව ඉදිරිපිටින් බලවතුකන්ද දක්වා පාර | 3.2 | 6.0 |
| 82. | වැද්දගල සපත්තු බෝක්කුව ළඟ සිට ගහලගමුවත්ත-කොටනකන්ද-කුඩුමීරිය හරහා අරබ්බඩ දක්වා පාර | 14.0 | 6.0 |
| 83. | කුඩව සිට කෙටලපත්තල - කඩවත පැලවත්ත හරහා අඹගහකන්ද දක්වා පාර | 16.0 | 6.0 |
| 84. | කුඩව සිට කෙටලපත්තල පරණ පාර | 3.5 | 2.5 |
| 85. | පුහුල්පැලපොල සිට පෙතියකන්ද දක්වා පාර | 3.6 | 2.5 |
| 86. | පනාපොල කඩවත හරහා සිංහරාජ පාර | 5.2 | 2.5 |
| 87. | පනාපොල සිට හපුගොඩ දක්වා පාර | 2.0 | 2.5 |
| 88. | ගමගෙපැත්ත සිට කොන්ගහකන්ද දක්වා පාර | 3.2 | 5.5 |
| 89. | කොස්ගුලන සිට කෝන්ගහකන්ද දක්වා පාර | 2.8 | 2.5 |
| 90. | පනාපොල සිට රනෝක්කන්ද දක්වා පාර | 2.8 | 2.5 |
| 91. | ගගලගමුව සිට තෛලමුල්ල දක්වා පාර | 1.8 | 2.5 |
| 92. | පනාපොල සිට මරන්දෙල දක්වා පාර | 1.2 | 2.5 |
| 93. | ගහලගමුව සිට තල්ලගස්හෝන දක්වා පාර | 4.4 | 2.5 |
| 94. | නාරම්මුල සිට මැදගෙදර - කොටනකන්ද දක්වා පාර | 2.8 | 2.5 |
| 95. | අඹගහකන්ද සිට මුගුණවල දක්වා පාර | 1.6 | 2.5 |
| 96. | පොතුපිටිය කැකිල්ලපිටිය - ඉළුඹකන්ද හරහා බම්බුමලේ දක්වා පාර | 13.4 | 6.0 |
| 97. | පොතුපිටිය ගොවිජන සේවා කාර්යාලය ඉදිරිපිට සිට දුංගහමුල්ල දක්වා පාර | 2.0 | 3.7 |
| 98. | පොතුපිටිය මුගුණවෙල පාර | 1.0 | 3.7 |
| 99. | පොතුපිටිය පිටගෙදර හාල්පන්තැන්න හරහා ඉළුඹකන්ද දක්වා | 4.8 | 6.0 |
| 100. | දුංගහමුල්ල ඉළුඹෙකන්ද පාර | 1.6 | 2.5 |
| 101. | නාගොඩ හරහා ඉළුඹෙකන්ද පාර | 2.8 | 2.5 |
| 102. | ගුරු අළුමෝදර සිට දෙනවක්කන්ද පාර | 4.8 | 2.5 |
| 103. | පොතුපිටිය ගල්පොත්තෙහේන පාර | 0.2 | 5.5 |
| 104. | පොතුපිටිය කිරල්වැටිය පාර | 0.4 | 5.5 |
| 105. | කත්ලාන සිට කැකිල්ලපිටිය හරහා ඉළුඹෙකන්ද පාර | 5.6 | 5.5 |
| 106. | කෙසෙල්වත්ත සිට කොපිකැල්ල දක්වා පාර | 2.4 | 5.5 |
| 107. | කත්ලාන සිට අඹේවෙල දක්වා පාර | 0.8 | 5.5 |
| 108. | කොහොඹකොටුව සිට අරුග්ගොඩ දක්වා පාර | 4.0 | 2.5 |
| 109. | බෝපිටිය සිට තණබෙල හරහා පනහැටගල පාර | 4.8 | 5.5 |
| 110. | බෝපිටිය සිට කොපිකැල්ල දක්වා පාර | 3.2 | 6.0 |
| 111. | බෝපිටිය සිට ගඟ අයින පාර | 0.6 | 3.7 |
| 112. | කොහොඹකොටුව සිට අඹේවෙල දක්වා පාර | 1.0 | 2.5 |
| 113. | නාරංකන්ද සිට තෙබුගල දක්වා පාර | 1.0 | 3.7 |
| 114. | කත්ලාන සිට ගම්මැද්ද දක්වා පාර | 0.6 | 5.5 |
| 115. | බෝපිටිය සිට අරුක්ගොඩ දක්වා පාර | 2.5 | 6.0 |
| 116. | ගම්මැද්ද මාකුඹුර හරහා අරුක්ගොඩ දක්වා පාර | 0.9 | 2.5 |
| 117. | අම්බලන්පුස්ස සිට ඉළුඹකන්ද දක්වා පාර | 2.4 | 6.0 |
| 118. | කත්ලාන සිට කෙසෙල්වත්ත-දංඅත්තාවල හරහා පොතුපිටිය දක්වා පාර | 3.2 | 5.5 |

| අංකය | පාරේ නම | දිග (කි. මී.) | පළල (මී.) |
|---|---|---|---|
| 119. | රඹුක රජගෙදර හරහා පන්නිල්කන්ද දක්වා පාර | 3.6 | 2.5 |
| 120. | බෝපිටිය සිට මුදලිකන්ද දක්වා පාර | 0.8 | 2.5 |
| 121. | කජුගස්වත්ත සිට බටේයාය දක්වා පාර | 0.8 | 2.5 |
| 122. | කෝපිකැල්ල සිට බෙලිකොටුව දක්වා පාර | 1.6 | 2.5 |
| 123. | රජවත්ත සිට කෝපිකැල්ල දක්වා පාර | 3.5 | 5.5 |
| 124. | රඹුක සිට දොඹගහකොටුව දක්වා පාර | 0.8 | 5.5 |
| 125. | බලවතුකන්ද තැන්නහේන පාර | 1 | 6 |
| 126. | කුඩුමීරිය ඉහලගෙදර පාර | 1.5 | 6 |
| 127. | කුඩුමීරිය පොල්ගහකන්ද පාර | 1.25 | 6 |
| 128. | වැද්දාගල නැගෙනහිර කැරැපත පාර | 2 | 6 |
| 129. | තලගහපැල්පොල අතුරු මාර්ගය | 0.75 | 6 |
| 130. | කුඩව පිට කැලේ මාර්ගය | 3 | 6 |
| 131. | පෙතියකන්ද පල්ලෙදෙනිය පාර | 2.5 | 6 |
| 132. | කුඩව කෙලපත්තල පාර | 8 | 6 |
| 133. | කුඩව බුත්කන්ද පාර | 7 | 6 |
| 134. | වත්තහේන කිරල්දෙනිය පාර | 1.5 | 6 |
| 135. | වංගුදොල අසල සිට කැටවලකන්ද පාර | 3 | 6 |
| 136. | උතුරු වැද්දගල සිට කැටවලකන්ද පාර | 2.5 | 6 |
| 137. | උතුරු වැද්දගල විද්‍යාලය අසල සිට කැටවලකන්ද පාර | 2 | 6 |
| 138. | උතුරු වැද්දගල විද්‍යාලය අසල සිට පුහුල්පැල්පොල පාර | 4 | 6 |
| 139. | මාවතදෙනිය අසල සිට කැටවලකන්ද පාර | 2.5 | 6 |
| 140. | වැද්දගල සිට පුහුල්පැල්පොල හරහා බලවතුකන්ද පාර | 4 | 6 |
| 141. | වැද්දාගල සිට පුහුල්පැල්පොල හරහා වැවගම පාර | 8 | 6 |
| 142. | සිංහරාජ පාරේ සිට මියනපලාව පාර | 3 | 6 |
| 143. | වැද්දාගල සිට පුහුල්පැල්පොල හරහා වැවගම පාර | 2.5 | 6 |
| 144. | මිල්ලගස්හේන සිට කුඩව විද්‍යාලය දක්වා පාර | 1 | 6 |
| 145. | කුඩව පෙතියකන්ද කරුවලදොල දක්වා පාර | 1.5 | 6 |
| 146. | කුඩව සිට පිටකැලේ හරහා අතුරුදොල පාර | 0.75 | 6 |
| 147. | පුහුල්පැල්පොල සිට පෙතියකන්ද පාර | 6 | 6 |
| 148. | පනාපොල කඩවත හරහා සිංහරාජ පාර | 8 | 6 |
| 149. | පනාපොල සිට හපුගොඩ පාර | 4 | 6 |
| 150. | ගමගෙපැත්ත සිට කෝන්ගහකන්ද පාර | 3 | 6 |
| 151. | කොස්ගුලන සිට කොන්ගහකන්ද පාර | 2.5 | 6 |
| 152. | වැද්දාගල කුඩුමීරිය පාර | 6 | 6 |
| 153. | දෙල්ගොඩ ගෝනලකන්ද හරහා පාර | 7 | 6 |
| 154. | වැද්දාගල මුදුනේ ගොඩැල්ල පාර | 1.5 | 6 |
| 155. | වැද්දාගල දොන්සිමා දෙනිය පාර | 2 | 6 |
| 156. | උතුරු වැද්දාගල කැටවලකන්ද 5 කනුව පාර | 2.5 | 6 |
| 157. | කලවාන ගැස්නාපොත්ත පාර | 6.5 | 6 |
| 158. | මියනපලාව තලගහපැල්පොල පාර | 3 | 6 |
| 159. | පුහුල්පැල්පොළ බටහේන පාර | 2 | 6 |
| 160. | වතුරාව පොත්දෙනිය පාර | 1.5 | 6 |
| 161. | අඹගහකන්ද පැලවත්ත පාර | 2.5 | 6 |
| 162. | වැද්දාගල සමුපකාරය අසලින් බලවතුකන්ද පාර | 3 | 6 |
| 163. | එලවැල්ල කොක්කාවිට පාර | 4 | 6 |
| 164. | වැද්දගලවත්ත පාර | 1.5 | 5 |
| 165. | වැද්දාගල නාගහහේන පාර | 0.5 | 6 |

| අංකය | පාරේ නම | දිග (කි. මී.) | පළල (මී.) |
|---|---|---|---|
| 166. | පුබුදුගම පාර | 1.5 | 6 |
| 167. | අරුක්ගොඩ ගම්මැද්ද පාර | 3 | 6 |
| 168. | තපස්සරකන්ද සුරුට්ටුවත්ත පාර | 1.5 | 6 |
| 169. | කොස්වත්ත දිසාපතිය පාර | 1.5 | 6 |
| 170. | දොන්සිමා දෙනිය පාර | 1.8 | 6 |
| 171. | කැටවලකන්ද 5 කනුව පාර | 2.2 | 6 |
| 172. | DHR කඩය අසලින් බුදුගෙ ගොඩැල්ල පාර | 2.6 | 6 |
| 173. | පොතුපිටිය දංගහකන්ද පාර | 1.9 | 6 |
| 174. | රඹුක ඇල්ල පාර | 3.2 | 6 |
| 175. | කලවාන ඇල්ලගාව ගොඩැල්ල පාර | 1.7 | 6 |
| 176. | කොස්වත්ත ඕකන්ද පාර | 2.3 | 6 |
| 177. | හගරංගල අකුලහේනවත්ත පාර | 1.3 | 6 |
| 178. | ගල්කැටිය ඇල්ලපිටහේන පාර | 2.1 | 6 |
| 179. | මීයනපලාව තලගහපැල්පොල පාර | 3.1 | 6 |
| 180. | වැද්දගල බලවතුකන්ද පාර | 2.7 | 6 |
| 181. | දොලහේන බටහිර පාර | 2.4 | 6 |
| 182. | කුඩව සිට පිටකැලේ පාර | 3.6 | 6 |
| 183. | පුහුල්පැල්පොල බටහේන පාර | 2.8 | 6 |
| 184. | වැද්දගල කැරැපත පාර | 2.1 | 6 |
| 185. | සමන්පුර උගුඩුකන්ද පාර | 1.9 | 6 |
| 186. | කුඩව බුත්කන්ද පාර | 3.2 | 6 |
| 187. | කුඩුමීරිය ඉහලගෙදර පාර | 1.8 | 6 |
| 188. | වේවැල්කඳුර අතපත්තුගොඩ පාර | 2.6 | 6 |
| 189. | සුදුවැලිපත අබේකෝන් වත්ත පාර | 1 | 6 |
| 190. | තපස්සරකන්ද ගල්පොත්තවිල පාර | 2.8 | 6 |
| 191. | වතුරාව පොත්දෙනිය පාර | 3.3 | 6 |
| 192. | කඳවැල්දොල පාර | 2.8 | 6 |
| 193. | කම්බියාදෙනිය පාර | 2.3 | 6 |
| 194. | කලවාන උසාවි ගොඩැල්ල පාර | 1.8 | 6 |
| 195. | විශ්කම්ගොඩ නාපිරිත්තගොඩ පාර | 2.3 | 6 |
| 196. | අඹගහකන්ද සිට පැලවත්ත පාර | 3.6 | 6 |
| 197. | අලුත්වත්ත පහන්පැලහේන්යාය පාර | 1.8 | 6 |
| 198. | පහල බෝපිටිය පාර | 3.2 | 6 |
| 199. | වතුරාව කිරල්දෙනිය පාර | 2.8 | 6 |
| 200. | දෙල්ගොඩ හතරමංහන්දිය නැගෙනහිර පාර | 3.1 | 6 |
| 201. | කලුමූකලාන වෙම්බියගොඩ පාර | 2.1 | 6 |
| 202. | කුකුලේගම ජන සමෘද්ධි මාවත | 2.8 | 3 |
| 203. | එලවැල්ල කොක්කාවිට පාර | 3.6 | 6 |
| 204. | ඇල්ලපිටහේන දික්දෙනිය පාර | 1.6 | 6 |
| 205. | හෙට්ටිකන්ද නාවලකන්ද පරණ ගම් සභා පාර | 2.6 | 6 |
| 206. | අම්බලමහේන ගල්වල පාර | 1.6 | 3 |
| 207. | බුලත්වැල්කොටුව පාර | 1.3 | 3 |
| 208. | බෙලිකොටුව කෙලින්හිටිය පාර | 2.1 | 3 |
| 209. | තණබෙල පිත්න ගොඩැල්ල පාර | 2.6 | 3 |
| 210. | කත්ලාන මාකුඹුර පාර | 2.6 | 3 |
| 211. | පොතුපිටිය මුකුණුවල පාර | 2.6 | 3 |

| අංකය | පාරේ නම | දිග (කි. මී.) | පළල (මී.) |
|---|---|---|---|
| 212. | කත්ලාන ඌරදෙනිය පාර | 2.6 | 3 |
| 213. | කලවාන පන්විල පාර | 1.6 | 3 |
| 214. | දෙල්ගොඩ හතරමංහන්දියෙන් යට පාර | 1.8 | 3 |
| 215. | කැප්පෙට්ටි මණ්ඩිය නාගහහේන පාර | 1.6 | 3 |
| 216. | කෝරලේගොඩවත්ත පාර | 2.8 | 6 |
| 217. | සුදුවැලිපොත දික්හේන පාර | 1.6 | 3 |
| 218. | ගල්කැටිය මැදහේන පාර | 1.6 | 3 |
| 219. | දෙල්ගොඩ තේ කම්හල අසලින් හඳුවෙල්කන්ද පාර | 2.8 | 3 |
| 220. | වැද්දගල වත්ත පාර | 2 | 3 |
| 221. | දෙල්ගොඩ පුබුදුගම පාර | 2.6 | 6 |
| 222. | පුස්සගහහේන හපුගොඩ පාර | 3.6 | 6 |
| 223. | මානාන අලුත්ගෙදර පාර | 1 | 3 |
| 224. | මිටියගුලන පාර | 2.2 | 6 |
| 225. | කුකුලේගම ඉද්දමල්දෙනිය පාර | 1.3 | 6 |
| 226. | අංගොඩකන්ද පාර | 2.1 | 6 |
| 227. | ගුරුගොඩවත්ත හරහා හඳුවෙල්කන්ද පාර | 3.2 | 6 |
| 228. | කලවාන මිනින්දෝරු කාර්යාලය අසල පාර | 1.3 | 6 |
| 229. | වේවැල්කඳුර පුවක්වත්ත පාර | 2.1 | 6 |
| 230. | කුකුලේගම දකුණ පරණ ගම් සභා පාර | 3.3 | 6 |
| 231. | නාවලකන්ද වත්තහේන පාර | 2.3 | 6 |
| 232. | යහලවත්ත ප්‍රියන්ත මයාගේ නිවස අසලින් පාර | 1.7 | 6 |
| 233. | දෙල්ගොඩ පන්සල් කන්ද පාර | 1.9 | 6 |
| 234. | තනබෙල මඤ්ඤොක්කාවත්ත පාර | 2.4 | 6 |
| 235. | අකුලහේන සුරංගනාකන්ද පාර | 1.8 | 6 |
| 236. | පරණ සිංහරාජ පාර | 2.2 | 6 |
| 237. | සුදුවැලිපත උලුවහුමිල්ල පාර | 2.6 | 6 |
| 238. | අඹගහවත්ත ගුලනහේන හරහා අලුත්වත්ත පාර | 2.4 | 6 |
| 239. | වැද්දගල මහවත්ත පාර | 1.7 | 6 |
| 240. | කොස්වත්ත එලවැල්ල රකුන්දලුව පාර | 2.4 | 6 |
| 241. | සමන්පුර සොමිකඳුරවත්ත පාර | 2.1 | 6 |
| 242. | ඕබොක්ක අක්කර 100, කරව්වාන හරහා හඟරංගල දක්වා පාර | 5.8 | 6 |
| 243. | ජාතික පාසල ඉදිරියෙන් දොලහේන සිට රජ්පුරුවත්ත දක්වා පාර | 5 | 5 |
| 244. | උසාවිය අසලින් බතලවත්ත පාර | 0.4 | 4 |
| 245. | පුබුදුගම පාලම හරහා කැරැපත දක්වා පාර | 2 | 4 |
| 246. | තපස්සරකන්ද කැරැපත ගොල්ලුම්පාන හරහා කොස්වත්ත දක්වා පාර | 2.3 | 6 |
| 247. | උතුරු වැද්දාගල පන්සල පාර කැටවලකන්ද හරහා කන්දෙවත්ත පාර | 3 | 4 |
| 248. | පනාපොල කොට්ටකන්ද නයිගලහේන බලගහලියද්ද පාර | 0.75 | 4 |
| 249. | උතුරු වැද්දාගල කැරැපත පාර සිට පාර බිංතැන්න දක්වා පාර | 1 | 4 |
| 250. | වේවැල්කඳුර බටහේන පැල්පිටිය පාර | 1 | 4 |
| 251. | දොලහේන මාර්ගයේ සිට සී. ටී වමින්ද මයාගේ නිවස අසළට ද එතැන් සිට ටී. විජේදාස මහතාගේ නිවස දක්වා පාර | 1 | 4 |
| 252. | තපස්සරකන්ද දවටගහකුඹුර පාර | 0.15 | 4 |
| 253. | බටහිර දොලහේන මාර්ගයේ පොඩි මහතාගේ නිවස අසළ සිට | | |
| | කවුඩුවැල්බටහේන්යාය මාර්ගය | 1 | 4 |
| 254. | වේවැල්කඳුර මැෂින් ගෙදර අසල හෙලඋඩ මාර්ගය | 1 | 4 |

09-224

## අගලවත්ත ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (අ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර, බස්නාහිර පළාත් සභාවේ කළුතර දිස්ත්‍රික්කයේ, අගලවත්ත ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් අගලවත්ත ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාල ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට්* පත්‍රයේ පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් අගලවත්ත ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ලලනි දීපිකා උඩුමුල්ල,
ලේකම් හා සභාවේ බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

2016 අගෝස්තු 23 වැනි දින,
අගලවත්ත ප්‍රාදේශීය සභාවේ දී ය.

**මාර්ග ලේඛනය - අගලවත්ත ප්‍රාදේශීය සභාව**

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *දිග (කි. මී.)* | *පළල (මීටර්)* |
|---|---|---|---|
| 01 | කෙවිටියාගල ඩැනී විජේතිලක මාවතේ මීටර් 200 පමණ ගිය විට කේ. වී. සිමියොන් මහතාගේ නිවස ඉදිරිපිටින් ආරම්භ වන කේ. වී. තිලකරත්න මහතාගේ නිවස අසලින් අවසන් වන මාර්ගය | 0.389 | 3.05 |
| 02 | කෙවිටියාගල ඩැනී විජේතිලක මාවතෙන් ආරම්භ වන මහමෙවුනා අසපුව අසලින් අවසන් වන මාර්ගය | 0.272 | 3.65 |
| 03 | අගලවත්ත - මතුගම ප්‍රධාන මාර්ගයෙන් ආරම්භ වන උපාලි සල්ගාදු මහතාගේ ඉඩමෙන් අවසන් වන විතානගේ මාවත | 0.125 | 3.05 |
| 04 | අගලවත්ත - ඕමත්ත මාර්ගයෙන් ආරම්භ වන පී. කේ. චන්දන කුමාර මහතාගේ නිවසින් අවසන් වන දෙයියන්ගොඩවත්ත මාර්ගය | 0.168 | 4.57 |
| 05 | ගොරකගොඩ දෙබරහේන මාර්ගයෙන් ආරම්භ වී කේ. ඩී. නිරෝෂනී පෙරේරා මියගේ නිවස අසලින් අවසන් වන මාර්ගය | 0.037 | 3.05 |
| 06 | ගොරකගොඩ මාටින්වත්ත මාර්ගයෙන් ආරම්භ වී ඇටිගෙඩිපොල වෙල්යායෙන් අවසන් වන මාර්ගය | 0.078 | 3.65 |
| 07 | ගිරිකොළ කණ්ඩගල මාර්ගයෙන් ආරම්භ වී එම්. ඒ. ජිනසේන මහතාගේ නිවස අසලින් අවසන් වන කැටකැරැල්ලගහවත්ත මාර්ගය | 0.18 | 3.05 |
| 08 | උඩවෙල විලේගොඩ මාර්ගයෙන් ආරම්භ වී ඒ. විජේසිංහ මහතාගේ නිවස අසලින් අවසන් වන මාර්ගය | 0.086 | 3.05 |
| 09 | උඩවෙල විලේගොඩ මාර්ගයෙන් ආරම්භ වී නයනි චතුරිකා මියගේ නිවස අසලින් අවසන් වන වෙන්දේසි ඉඩම මාර්ගය | 0.099 | 4.57 |

| අනු. අංකය | මාර්ගයේ නම | දිග (කි. මී.) | පළල (මීටර්) |
|---|---|---|---|
| 10 | උඩවෙල කණ්ඩගල මාර්ගයෙන් ආරම්භ වී ඩී. ඒ. ඩී. සී. කුලතුංග මහතාගේ නිවස අසලින් අවසන් වන මාර්ගය | 0.27 | 3.05 |
| 11 | උඩවෙල පීල්ලහේන මාර්ගයෙන් ආරම්භ වී බී. වී. ප්‍රේමදාස මහතාගේ නිවස අසලින් අවසන් වන මාර්ගය | 0.171 | 3.65 |
| 12 | ගොරකගොඩ මාටින්වත්ත යටියන මාර්ගයෙන් ආරම්භ වී නිමල් විජේනායක මහතාගේ නිවස ඉදිරිපිටින් අවසන් වන මාර්ගය | 0.1 | 3.65 |
| 13 | හැළඹ මිල්ලගහවත්ත මාර්ගයෙන් ආරම්භ වී ටී. ඩී. වසන්ත මහතාගේ නිවස අසලින් අවසන් වන ගොඩේවත්ත මාර්ගය | 0.4 | 4.57 |
| 14 | දියපත්තුගම අයිලකන්ද මාර්ගයෙන් ආරම්භ වී ගුණවතී වෙල්ගම මහත්මියගේ නිවස අසලින් අවසන් වන අයිලකන්ද පීල්ලහේන මාර්ගය | 0.15 | 3.05 |
| 15 | හැළඹ වැලිගොඩැල්ල ගල්කන්ද මුදුනින් ආරම්භ වී සුජීව කුමාර මහතාගේ නිවස අසලින් අවසන් වන හැළඹ ගල්කන්ද අසල මාර්ගය | 0.095 | 3.05 |

09-308

---

## මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් වරිපනම් කාර්යය සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් නියමය කිරීමට තීරණය කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ වරිපනම නියම කිරීමේ කාර්යය සඳහා ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ නියමයන් සම්පූර්ණ කර ඇති බව වැඩිදුරටත් දන්වමි.

සී. පී. නවරත්න,
ලේකම්,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව.

2016 අගෝස්තු මස 18 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ
ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

### තීරණය

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව, මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් දියුණු කළ ප්‍රදේශයක්/ප්‍රදේශ බවට ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශයේ/ප්‍රදේශවල පිහිටා ඇති නිශ්චල දේපළවල සහ ඒ ඒ පන්තියට හෝ වර්ගයට අයත් නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකම්, එකී පනතේ 146 වැනි වගන්තියේ නියමය පරිදි සම්මත කිරීමටත්,

ඉහත කී 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල යටතේ එකී නිශ්චල දේපළ අතරින් කුඹුරු ඉඩම් හැර සෙසු සියළුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල එක් එක් වාර්ෂික වටිනාකමෙන් පහත සඳහන් I,II, III, IV, V සහ VI උපලේඛනවල සඳහන් මායිම්වලට අදළ ප්‍රතිශතයන්ගෙන් වරිපනමක්

2018 වර්ෂය සඳහා නියම කිරීමටත්, සහ

එකී වරිපනම් ඉහත වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවන ලෙසට, එකී 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තිය යටතේ විධානය කිරීමටත්, එකී ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන්, එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මම මෙයින් තීරණය කරමි.

***I* වන උපලේඛනය**

*අම්පිටිය කලාපය*

| *අනු. අංකය* | *පාරේ නම* | *මායිම් පිළිබඳ තොරතුරු* | *ප්‍රතිශතය* |
|---|---|---|---|
| 01 | මී කණුව පන්සල පාර | මී කණුව බස් නැවතුමේ සිට වමට ඇති මාර්ගයේ මී කණුව පන්සල දක්වා - මීටර් 400 | 5% |
| 02 | වික්ටෝරිය උද්‍යාන පාර | මී කණුවේ බස්නැවතුම අසල 2/3 බෝක්කු කණුවේ සිට වික්ටෝරියා උද්‍යාන පාරෙන් ගොස් දිගතැන්න පාරේ අවසානය දක්වා - මීටර් 500 | 7% |
| 03 | වැලිකන්ද පාර | මී කණුව බස්නැවතුම්පල අසල සිට වැලිකන්ද පාරේ අවසානය දක්වා - මීටර් 150 | 7% |
| 04 | දිගතැන්න පාර | ගුරුදෙණිය ප්‍රතිභා මාවතෙන්, දිගතැන්න පාරේ 706/3 ලිපිනය සඳහන් කඩය දක්වා - මීටර් 800 | 6% |
| 05 | වලගම්මැද්ද - කෝන්කුඹුර පාර | අම්පිටිය ප්‍රධාන පාරෙන් වලගම්මැද්ද පාරේ ඇති තුංමං හන්දියෙන් දකුණට මීටර් 800ක් කෝන්කුඹුර පාර දක්වා | 7% |
| 06 | වලගම්මැද්ද - මීකණුව පාර | අම්පිටිය ප්‍රධාන පාරෙන් වලගම්මැද්ද පාරට හැරී හමුවන තුංමං හන්දියෙන් වමට හැරී මීටර් 500ක් දුරින් මීකණුව දෙමළ විදුහල දක්වා | 7% |
| 07 | මැද්දේපතන - කොළණිය පාර නව | මැද්දේපතන කොළණිය පාරේ JMC ආයතනයෙන් ආරම්භ වී කි. මී. 1ක් දුරින් ජල ටැංකිය දක්වා | 6% |
| 08 | වැවතැන්න පාර | වැවතැන්න පාරේ දැනට වරිපනම් සීමාවේ සිට ඇති සියළු අතුරු මාර්ග | 6% |
| 09 | පූලියද්ද පාර | තලාතුඔය පාරෙන් පූලියද්ද පාරට හැරෙන හන්දියේ සිට එච්. බී. ඒකනායක මහතාගේ නිවස දක්වා කි. මී. 1ක් දුර පාර | 6% |
| 10 | රදාගස්පාන පාර | පූලියද්ද පාරෙන් රදගස්පාන පාරට හැරෙන හන්දියේ සිට කි. මී. 1ක් දුරින් බුදමවත්ත ගල්වල පාර දක්වා | 5% |

***II* උපලේඛනය**

*මාළිගාතැන්න කලාපය*

| *අනු. අංකය* | *පාරේ නම* | *මායිම් පිළිබඳ තොරතුරු* | *ප්‍රතිශතය* |
|---|---|---|---|
| 01 | එකමුතු මාවත | මවුන්ට් පැරඩයිස් හන්දිය ඉදිරිපිට ඇති අතුරු මාර්ගයෙන් ආරම්භ වී මීටර් 600ක් දුරින් පිහිටි මහවැලි ගඟ දක්වා මාර්ගය | 4% |

| අනු. අංකය | පාරේ නම | මායිම් පිළිබඳ තොරතුරු | ප්‍රතිශතය |
|---|---|---|---|
| 02. | ග්‍රීන් හෙරිටේජ් නිවාස ව්‍යාපෘති පාර | ප්‍රධාන පාරෙ ග්‍රීන් හෙරිටේජ් නිවාස ව්‍යාපෘතිය අසලින් ඇති පාරේ මීටර් 300ක් දක්වා | 5% |
| 03. | උඩතැන්න හාරගම පාර | හාරගම ප්‍රධාන පාරේ දකුණින් ඇති දයා කන්ස්ට්‍රක්ෂන් පාරේ මීටර් 100ක් දුරින් ඇති තුංමං හන්දියෙන් දකුණට ඇති මාර්ගයේ කි. මී. 2ක් දක්වා උඩතැන්න හාරගම පාර | 3% |
| 04. | උඩතැන්න - ගුරුදෙණිය පාර | හාරගම ප්‍රධාන මාර්ගයෙන් දකුණට ඇති මහවැලි බිෂ් හන්දියෙන් හැරී කි.මීටර් 2ක් දුරින් පිහිටි ගුරුදෙණිය පන්සල අසලින් ගුරුදෙණිය පාලමට වැටෙන හන්දිය දක්වා | 3% |
| 05. | ගුරුදෙණිය - තලාතුඔය පාර | ගුරුදෙණිය බස්නැවතුම්පොළ අසලින් වමට ඇති මාර්ගයේ මීටර් 500ක් දුරින් පිහිටි පාතහේවාහැට සීමාව දක්වා | 5% |
| 06. | දඹවෙල ගුරුදෙණිය පාර | 4/1 පාලම අසලින් දඹවෙල පාරට හැරෙන හන්දියේ සිට මීටර් 2500ක් | 7% |

### *III උපලේඛනය*

*ගුරුදෙණිය කලාපය*

| අනු. අංකය | පාරේ නම | මායිම් පිළිබඳ තොරතුරු | ප්‍රතිශතය |
|---|---|---|---|
| 01 | ගුඩ්හෝප් එස්ටේට් පාර | ගුරුදෙණිය ප්‍රධාන මාර්ගයේ බෙන්සීස් සුපර් ඉදිරිපිට ඇති ගුඩ්හෝප් මාවතේ ආරම්භයේ සිට Regency House හෝටලය දක්වා මාර්ගය මීටර් 600ක් | 7% |
| 02 | ප්‍රතිභා මාවත | ගුරුදෙණිය ප්‍රධාන මාර්ගයෙන් ප්‍රතිභා මාවත ආරම්භයේ සිට කි. මී. 1ක් දුරින් | 6% |
| 03 | ඉහළ තැන්නේ කුඹුර මාර්ගය | ගුරුදෙණිය ප්‍රධාන මාර්ගයේ MOH කාර්යාලය අසලින් ඉහලට යන මාර්ගයේ මීටර් 1800ක් දුරින් පිහිටි ඉහළ තැන්නේකුඹුර ප්‍රජා ශාලාව දක්වා | 7% |
| 04 | K II මාර්ගය | K II පාරේ නගර සීමාවේ සිට ධර්මරාජ මාවතේ නගර සභා සීමාවේ අවසානය දක්වා (පැනරාමා රිසෝට් අතුරු මාර්ගය ද ඇතුළත්ව) | 9% |
| 05 | ඉහළ තලපියන්නාව පාර (මොහන්දිරම් වත්ත පාර) | අම්පිටිය - ගුරුදෙණිය පාරේ තලපියන්නාව පාර පුවරුව අසලින් මීටර් 300ක් දුරින් පිහිටි හන්දියෙන් දකුණට දිවෙන මාර්ගයේ ගෞතමාරාමය දක්වා | 6% |
| 06 | පහළ තලපියන්නාව පාර | අම්පිටිය - ගුරුදෙණිය පාරේ තලපියන්නාව පාරට හැරෙන හන්දියෙන් ආරම්භ වී Regency House හෝටලය දක්වා | 6% |

### *IV උපලේඛනය*

*හන්තාන කලාපය*

| අනු. අංකය | පාරේ නම | මායිම් පිළිබඳ තොරතුරු | ප්‍රතිශතය |
|---|---|---|---|
| 01. | රිච්මන්ඩ් හිල් රෙසිඩන්ස් | ප්‍රධාන මාර්ගය ආරම්භයේ සිට මීටර් 700ක් දක්වා | 5% |
| 02. | මොරගොල්ලාගම පාර | හන්තාන 4 කණුව අසල සිට මීටර් 1150ක් මොරගොල්ලාගම මාර්ගයේ අවසානය දක්වා | 1% |
| 03. | ඉහළ ජල තටාක පාර | ඉහළ ජල තටාක පාරේ පන්සල අසලින් ආරම්භ වී හයිලන්ඩ් හෝටලය දක්වා මීටර් 1550ක් | 6% |
| 04. | ඉහළ ජල තටාක වටරවුම් පාර | ඉහළ ජලතටාක පාරෙන් හෙල මාවත ආරම්භ වන ස්ථානයේ සිට වටරවුම් පාරෙන් වන රක්ෂණ මාවතේ ආරම්භය දක්වා මීටර් 8500ක් | 6% |
| 05. | සාරානන්ද පාර | සාරානන්ද හන්දියෙන් ආරම්භ වී කොළඹ පාර දක්වා මීටර් 900ක් | 6% |
| 06. | සුබෝධාරාම පාර | සාරානන්ද පාරෙන් හැරී සුබෝධාරාම පාරේ මීටර් 700ක් | 6% |
| 07. | මහවැලි මාවත | ගම්පොල පාරෙන් ආරම්භ වී සාරානන්ද පාර දක්වා මීටර් 700ක් | 6% |
| 08. | ගොඩගන්දෙණිය පාර | ගොඩගන්දෙණිය පාරේ ආරම්භයේ සිට මීටර් 700ක් යටිනුවර ප්‍රාදේශීය සභා සීමාව දක්වා | 6% |
| 09. | ගල්වල පාර-ගොඩගන්දෙණිය | ගොඩගන්දෙණිය පාරේ සිට කොළඹ දක්වා මීටර් 900ක් | 6% |
| 10. | කනත්ත පාර | දංගොල්ල මාර්ගයේ ප්‍රාදේශීය සභා සීමාවේ සිට බෝවලවත්ත දක්වා | 4% |
| 11. | ස්ප්‍රිංහිල්වත්ත පාර | වජිරාරාම ආරාමයට යන පාරේ සිට ස්ප්‍රිංහිල්වත්ත අවසානය දක්වා | 3% |

### *V උපලේඛනය*

*සරසවිගම කලාපය*

| අනු. අංකය | පාරේ නම | මායිම් පිළිබඳ තොරතුරු | ප්‍රතිශතය |
|---|---|---|---|
| 01 | සරසවිගම පාර | සරසවිගම ප්‍රජාශාලාව අසලින් ආරම්භ වී සරසවිගම මාර්ගය අවසානය දක්වා මීටර් 1000ක් | 1% |
| 02 | ලෙජස්ට්‍රෝමියා පටුමග | සරසවිගම ප්‍රධාන මාර්ගය අසලින් ආරම්භ වී ලෙජස්ට්‍රෝමියා පටුමගේ අවසානය දක්වා මීටර් 1500ක් | 1% |
| 03 | ෆයිනස්වත්ත පාර | සරසවිගම ප්‍රධාන මාර්ගය අසලින් ආරම්භ වී ෆයිනස්වත්ත මාර්ගයේ අවසානය දක්වා 1500ක් | 1% |
| 04 | මෝබ්‍රේ පාර | ප්‍රාදේශීය සභා ජලටැංකිය අසලින් ආරම්භ වී මෝබ්‍රේ මාර්ගයේ අවසානය දක්වා 1500ක් | 1% |
| 05 | සමාධි මාවත | සරසවිගම ප්‍රධාන මාර්ගය අසලින් ආරම්භ වී සමාධි මාවත අවසානය දක්වා 1500ක් | 1% |

*VI උපලේඛනය*

*හාරගම කලාපය :*

| *අනු. අංකය* | *පාරේ නම* | *මායිම් පිළිබඳ තොරතුරු* | *ප්‍රතිශතය* |
|---|---|---|---|
| 01 | හාරගම පළමු පටුමග | හාරගම නිම්මි කඩේ අසල සිට මහවැලි ගඟ දක්වා ඇති මාර්ගය (නිම්මි කඩේ අසලින් මීටර් 50ක් ඇතින් හමුවන තුංමං හන්දියෙන් දකුණට) දුර මීටර් 700ක් | 4% |
| 02 | හාරගම දෙවන පටුමග | හාරගම නිම්මි කඩේ අසල සිට මීටර් 50ක් ඇතින් ඇති බෝක්කුව අසල සිට වම් පැත්තට උඩරට සඳැල්ල දක්වා ඇති මාර්ගය දුර කි. මී. 2ක් | 4% |
| 03 | උඩරට සඳැල්ල පාර | හාරගම හන්දියේ ශ්‍රී සුමන මාවතෙන් ආරම්භ වී උඩරට සඳැල්ල මායිම දක්වා දිවෙන මාර්ගය දුර කි. මී. 1.3ක් | 10% |
| 04 | ගෝනවත්ත පාර | හාරගම හන්දියේ ශ්‍රී සුමන මාවතේ සිට මීටර් 50ක් ඇතින් වමට ඇති ගෝනවත්ත පාරේ ආරම්භයේ සිට මහවැලි ගඟ දක්වා ඇති මාර්ගය දුර මීටර් 1600ක් | 2% |
| 05 | නො. 03 පාර | ගීතිකා හාර්ඩ්වෙයාර් ඉදිරිපිටින් ආරම්භ වී නො. 03 වටරවුම් පාර දුර කි. මී. 2.5 ක් | 1% |
| 06 | මාළිගාතැන්න වත්ත පාර | හාරගම ප්‍රධාන මාර්ගයේ මුවුන්ට් පැරඩයිස් හන්දියෙන් ආරම්භ වී මාළිගාතැන්න වත්ත පාරේ චන්දන සෙවන නිවස දක්වා දුර මීටර් 800ක් | 4% |
| 07 | සිංහාරගම පාර | හාරගම හන්දියෙන් ආරම්භ වී සිංහාරගම පාරේ ග්‍රාම නිලධාරි කාර්යල අසල පාළම දක්වා දුර මීටර් 1000ක් | 4% |
| 08 | නො. 04 පාර | හාරගම හන්දියේ රාජා කඩේ අසලින් ආරම්භ වී මීටර් 700ක් දුරින් පිහිටි තුංමං හන්දියෙන් වමට ඇති පාරේ 4/64ඩී සමුද්‍රා නිවස දක්වා මාර්ගය දුර මීටර් 1500ක් තවද ඉහත කී මීටර් 700ක් දුරින් පිහිටි තුංමං හන්දියෙන් දකුණට ඇති පාරේ මීටර් 1000ක් දුරින් ඒ. වී. කරුණාරත්න අංක 75, හාරගම, ගුරුදෙණිය නිවස දක්වා | 1% |
| 09 | නො. 04II පාර | හාරගම බස්නැවතුම්පල අසලින් ආරම්භ වී මීටර් 300ක් දක්වා | 1% |

09-457

---

## කැලණිය ප්‍රාදේශීය සභාව

### 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව වර්ෂ 2016 ක් වූ අගෝස්තු මස 03 දින අංක 2016/2849 යටතේ පහත තීරණය ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් සාදන ලදුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1888/47 හා 2014.11.14 දින දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළකරන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා, 1989 අංක 12 දරන පළාත් සභා ආනුශංගික විධිවිධාන පනතේ 2 වන වගන්තියෙහි වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලදුව ඒ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6 හා 2015.12.28 දිනැති *ගැසට් පත්‍රය* යටතේ නිවේදනය කර ඇත.

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය යටතේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව එකී සම්මත අතුරු ව්‍යවස්ථා කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017.01.01 දින සිට අදාළ විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ තීරණය කරමි.

තවද මෙම තීරණය ගනු ලබන මෙදින වන විට කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ අදාළ කර ගනිමින් බලාත්මක වන පහත උපලේඛනගත නාමයන් යටතේ විස්තර කරන සම්මත අතුරු ව්‍යවස්ථා, එම සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ එතෙක් ගනු ලබන ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි 2016.12.31 දිනෙන් පසුවට කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා අදාල නොවිය යුතු බවට ද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව තීරණය කරමි.

***ඉහත කී උපලේඛනය***

1988.08.23 දින අංක 520/7 දරන අතිවිශේෂ *ගැසට් පත්‍රය*

| *අතුරු ව්‍යවස්ථාවේ අංකය* | *අතුරු ව්‍යවස්ථාව* |
|---|---|
| 11 | ලැගුම් නිවාස පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| 14 | හෝටල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| 16 | බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| 19 | මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| 20 | මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| 21 | අප්‍රසන්න හා අන්තරායදායක වෙළෙඳාම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| 28 | සංචාරක වෙළෙන්දෝ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| 39 | ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |

ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය,
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කැලණිය ප්‍රාදේශීය සභාව,

2016 අගෝස්තු මස 03 වැනි දින.

09-461

# විවිධ දැන්වීම්

## මහනුවර මහා නගර සභාව

### මහනුවර මහා නගර සභාව සතු අනුමත වීථිවල නවතා තැබෙන වාහනවලින් අයකරනු ලබන ගාස්තු ප්‍රමාණයන් පැනවීම

252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ අංක 267 හා 272 දරන වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව මහනුවර මහා නගර සභාවේ 2002.05.26 දින පැවති මහ සභා රැස්වීමේදී අංක 9(122) යටතේ සභා සම්මත කරනු ලැබූ 2002.08.09 දින අංක 1249 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (අ) වැනි කොටසේ පළ කරන ලද මහනුවර මහා නගර සභාවේ අතුරු ව්‍යවස්ථා මාලාවේ iii වන කොටස යටතේ කියැවෙන වාහන නතර කර තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි 2015.10.14 දින අංක 8 (25) දරන සභා සම්මුතියෙන් අනුමත කොට ඇති පහත සඳහන් වාහන නවතා තැබීමේ ගාස්තු 2016.09.01 දින සිට අයකරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

චන්දන තෙන්නකෝන්,
විශේෂ කොමසාරිස්.

මහනුවර මහා නගර සභාවේ දී ය.

*අනුමත වාහන නවතා තැබීමේ ගාස්තු :*

*(අ) අනුමත වීථිවල (කොළඹ වීදිය හැර)*

(1) මෝටර් රථ/කැබ්රථ/ වෑන් රථ/ජීප් රථ – පළමු පැයට හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 30.00ක් සහ ඉන්පසු වැඩිවන සෑම පැයක් හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 50.00 බැගින්

(2) බස්රථ/ලොරිරථ/ට්‍රක්රථ – පළමු පැයට හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 50.00 ක් සහ ඉන්පසු වැඩිවන සෑම පැයකටම හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 75.00 බැගින්.

(3) ත්‍රී රෝද රථ - පළමු පැයට හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 30.00ක් සහ ඉන් පසු වැඩිවන සෑම පැයකටම හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 30.00බැගින්

(4) යතුරු පැදි - පළමු පැයට හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 20.00 ක් බැගින් සහ ඉන්පසු වැඩිවන සෑම පැයකටම (බදු සහිතව) රු. 10.00ක් බැගින්

*(ආ) කොළඹ වීදිය*

(1) මෝටර් රථ/කැබ්රථ/වෑන් රථ/ජීප් රථ - පළමු පැයට හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 30.00ක් සහ ඉන්පසු වැඩිවන සෑම පැයකටම හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 50.00 බැගින්.

(2) බස් රථ/ලොරි රථ/ට්‍රක් රථ - පැයකට හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 50.00 බැගින් සහ ඉන් පසු වැඩිවන සෑම පැයකටම හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 50.00 බැගින්.

(3) ත්‍රී රෝද රථ - පළමු පැයට හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 30.00 ක් සහ ඉන් පසු වැඩිවන සෑම පැයකටම හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 30.00 බැගින්.

(4) යතුර පැදි - පළමු පැයට හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 20.00ක් බැගින් සහ ඉන්පසු වැඩිවන සෑම පැයකටම (බදු සහිතව) රු. 10.00 ක් බැගින්

09-456

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.